සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 51 - චිත්‍ර කලාව

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

රහස්‍යයයි

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගය.

2018 - අගෝස්තු

## 51 - චිත්‍ර කලාව . 1, 11, 111,

ලකුණු දීමේ පටිපාටිය

චිත්‍ර කලාව 1. -මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. 1 වන කොටස බහු වරන ප්‍රශ්න 40 කින් ද දෙවන කොටස ව්‍යුහගත ප්‍රශ්න 06 කින් ද යුක්ත වේ. බහුවරණ පත්‍රය අනිවාර්ය වන අතර දෙවන කොටසට අයත් අ , ආ , ඉ , යන අනු කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න තුනක් තෝරාගත යුතු වේ. බහු වරණ ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් ලැබෙන අතර ව්‍යුහගත ප්‍රශ්න තුනට 20 බැගින් ලකුණු 60ක් හිමි වේ. මේ අනුව ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් ලැබේ.

චිත්‍ර කලාව 11. -ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙහි ඇතුළත් වනුයේ එක් ප්‍රායෝගික ක්‍රියාකාරකමක් සඳහා වූ එක් ප්‍රශ්නයකි. ''නිදහස් රේඛාමය ඇඳීම හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය'' යනුවෙන් මෙය හැඳින් වේ.
මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

චිත්‍ර කලාව 111. -ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙය ''අ'' ''ආ'' ''ඉ'' යනුවෙන් කොටස් තුනකින් යුක්ත ය.
'' අ '' - චිත්‍ර සංරචනය
'' ආ'' - මෝස්තර නිර්මාණය
'' ඉ '' - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය
ඉහත සඳහන් කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් ප්‍රශ්න පත්‍ර තුනට ලකුණු 300 කි. එය තුනෙන් බෙදීමෙන් ( 300 ÷ 3 = 100 ) අවසාන ලකුණු ගණනය කළ යුතුවේ.

පළමුවැනි ප්‍රශ්න පත්‍රයට ලකුණු දීමේදී කොටස් දෙක ගැන වෙන වෙන ම ලකුණු කිරීමට විශේෂයෙන් සැලකිලිමත් වන්න. පළමු වැනි කොටස වන බහුවරණ පත්‍රයට පිළිතුරු සපයා ඇත්තේ එම පත්‍රයේම බැවින් නිවැරදිව හරි වැරදි ලකුණු කොට නිවැරදි පිළිතුරු ගණනය කොට හිමි ලකුණ පිළිතුරු පත්‍රයේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදන්න. ඉතිරි පිළිතුරු තුන වෙන් වෙන්ව අගයා එකිනෙක කොටස් වලට හිමි ලකුණු නිවැරදිව අදාල පිළිතුර අවසානයේ ලියා එකතුකොට දක්වන අතර එම ප්‍රශ්න තුනේ එකතුව බහුවරන පත්‍රයේ ඉදිරි පිටුවේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදා එකතු කරන්න.

අවසානයේ එකිනෙක පිළිතුරට හිමි ළකුණු වෙන වෙන ම ප්‍රශ්න අංක යටතේ මුල්පිටුවට ගෙන පිළිතුරු සියල්ලේ ම එකතුව නිවැරදිව ගණනය කොට 1 වැනි පත්‍රයට හිමි කොටුව තුළ යොදන්න. එසේ ම 11. වැනි හා 111. වැනි පත්‍රවලට නිර්ණායකයන් අනුව හිමි වූ ලකුණු ද මුල් පිටුවේ අදාළ කොටුතුළ යොදන්න.

පත්‍ර තුනට හිමි ළකුණු 300 න් භාගයක් සේ ලැබේ. එය තුනෙන් බෙදීමෙන් අවසාන ලකුණ තීරණය කළ යුතු වේ. ඉලක්කම් ලිවීමේ දී ඉතා සැළකිලිමත්ව පැහැදිලිව හා නිරවුල්ව අදාළ කොටු තුළ ලියා දක්වන්න.

ලකුණු කරන ලද සෑම උත්තර පත්‍රයක් ම වෙනත් අයෙකු විසින් පරීක්‍ෂා කළ යුතුවේ. මුල් පරීක්‍ෂක වරයාත් පරීක්‍ෂා කරන පරීක්‍ෂකවරයාත් තම සංකේත අංක අනිවාර්යයෙන්ම පිළිතුරු පතේ සටහන් කළ යුතු ය.

ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේ දී ද තමතමන් විසින්ම කළ යුතු ය. කියවන විට ලිවීම නොකළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයට හිමි ලකුණ මුල්පිටුවට ගැනීමේදීත් එම ලකුණු, ලකුණු ලැයිස්තුවට ගැනීමේදීත් ඉතා නිවැරදිව කළ යුතු ය. සෑම ඉලක්කමක්ම නිවැරදිව ලිවිය යුතු සේම ඉතා පැහැදිලිව තිබීම ද වැදගත් ය. ඉලක්කමක් වැරදුනහොත් එක ඉරකින් කපා නැවත ලියා අත්සන යොදන්න. මැකීම හෝ සීරීම හෝ මකන දියර භාවිතය නොකළ යුතු ය.

අපේක්‍ෂකයන් නියමිත ප්‍රමාණයට වඩා පිළිතුරු ලියා තිබෙන්නට පිළිවන. එවැනි අවස්ථාවල දී සියලුම පිළිතුරු ලකුණු කොට අඩු ලකුණු ලබාගත් වැඩිපුර ලියා ඇති පිළිතුරු කපා හරින්න. කොටස් තුනෙන් නියමිත ප්‍රමාණය නොසලකා ලියා ඇති අවස්ථාවලදී ද එම පිළිතුරු කපා හරින්න. කපා හරින ලද පිළිතුරු සම්බන්ධයෙන් පහතින් සටහනක් යොදන්න. පිළිතුරු පත් පළමු ලකුණු කිරීම සඳහා රතුපාට පෑනක් භාවිත කිරීම අනිවාර්යය වේ.

## 1. පත්‍රය - චිත්‍ර කලාව

අභිමතාර්ථ :-

1 - ශ්‍රී ලංකාව, ඉංදියාව, යුරෝපය ආශ්‍රිත කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ ශිෂ්‍යයා අත්පත් කරගෙන ඇති නිපුණතා පිරික්සීම.

2 - විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.

3 - උගත් විෂය කරුණු නිරවුල්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම

රහස්‍යයයි

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගය.

2018 - අගෝස්තු

## 51 - චිත්‍ර කලාව . 1, 11, 111,

ලකුණු දීමේ පටිපාටිය

චිත්‍ර කලාව 1. -මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. 1 වන කොටස බහු වරන ප්‍රශ්න 40 කින් ද දෙවන කොටස ව්‍යුහගත ප්‍රශ්න 06 කින් ද යුක්ත වේ. බහුවරණ පත්‍රය අනිවාර්ය වන අතර දෙවන කොටසට අයත් අ , ආ , ඉ , යන අනු කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න තුනක් තෝරාගත යුතු වේ. බහු වරණ ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් ලැබෙන අතර ව්‍යුහගත ප්‍රශ්න තුනට 20 බැගින් ලකුණු 60ක් හිමි වේ. මේ අනුව ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් ලැබේ.

චිත්‍ර කලාව 11. -ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙහි ඇතුළත් වනුයේ එක් ප්‍රායෝගික ක්‍රියාකාරකමක් සඳහා වූ එක් ප්‍රශ්නයකි. "නිදහස් රේඛාමය ඇඳීම හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය" යනුවෙන් මෙය හැඳින් වේ.
මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

චිත්‍ර කලාව 111. -ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙය "අ" "ආ" "ඉ" යනුවෙන් කොටස් තුනකින් යුක්ත ය.
" අ " - චිත්‍ර සංරචනය
" ආ" - මෝස්තර නිර්මාණය
" ඉ " - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය
ඉහත සඳහන් කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් ප්‍රශ්න පත්‍ර තුනට ලකුණු 300 කි. එය තුනෙන් බෙදීමෙන් ( 300 ÷ 3 = 100 ) අවසාන ලකුණ ගණනය කළ යුතුවේ.

පළමුවැනි ප්‍රශ්න පත්‍රයට ලකුණු දීමේදී කොටස් දෙක ගැන වෙන වෙන ම ලකුණු කිරීමට විශේෂයෙන් සැලකිලිමත් වන්න. පළමු වැනි කොටස වන බහුවරණ පත්‍රයට පිළිතුරු සපයා ඇත්තේ එම පත්‍රයේම බැවින් නිවැරදිව හරි වැරදි ලකුණු කොට නිවැරදි පිළිතුරු ගණනය කොට හිමි ලකුණ පිළිතුරු පත්‍රයේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදන්න. ඉතිරි පිළිතුරු තුන වෙන් වෙන්ව අගයා එකිනෙක කොටස් වලට හිමි ලකුණු නිවැරදිව අදාල පිළිතුර අවසානයේ ලියා එකතුකොට දක්වන අතර එම ප්‍රශ්න තුනේ එකතුව බහුවරන පත්‍රයේ ඉදිරි පිටුවේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදා එකතු කරන්න.

අවසානයේ එකිනෙක පිළිතුරට හිමි ලකුණු වෙන වෙන ම ප්‍රශ්න අංක යටතේ මුල්පිටුවට ගෙන පිළිතුරු සියල්ලේ ම එකතුව නිවැරදිව ගණනය කොට 1 වැනි පත්‍රයට හිමි කොටුව තුළ යොදන්න. එසේ ම 11. වැනි හා 111. වැනි පත්‍රවලට නිර්ණායකයන් අනුව හිමි වූ ලකුණු ද මුල් පිටුවේ අදාළ කොටුතුළ යොදන්න.

පත්‍ර තුනට හිමි ලකුණු 300 න් භාගයක් සේ ලැබේ. එය තුනෙන් බෙදීමෙන් අවසාන ලකුණ තීරණය කළ යුතු වේ. ඉලක්කම් ලිවීමේ දී ඉතා සැළකිලිමත්ව පැහැදිලිව හා නිරවුල්ව අදාළ කොටු තුළ ලියා දක්වන්න.

ලකුණු කරන ලද සෑම උත්තර පත්‍රයක් ම වෙනත් අයෙකු විසින් පරීක්ෂා කළ යුතුවේ. මුල් පරීක්ෂක වරයාත් පරීක්ෂා කරන පරීක්ෂකවරයාත් තම සංකේත අංක අනිවාර්යයෙන්ම පිළිතුරු පතේ සටහන් කළ යුතු ය.

ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේ දී ද තමතමන් විසින්ම කළ යුතු ය. කියවන විට ලිවීම නොකළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයට හිමි ලකුණු මුල්පිටුවට ගැනීමේදීත් එම ලකුණු, ලකුණු ලැයිස්තුවට ගැනීමේදීත් ඉතා නිවැරදිව කළ යුතු ය. සෑම ඉලක්කමක්ම නිවැරදිව ලිවිය යුතු සේම ඉතා පැහැදිලිව තිබීම ද වැදගත් ය. ඉලක්කමක් වැරදුනහොත් එක ඉරකින් කපා නැවත ලියා අත්සන යොදන්න. මැකීම හෝ සීරීම හෝ මකන දියර භාවිතය නොකළ යුතු ය.

අපේක්ෂකයන් නියමිත ප්‍රමාණයට වඩා පිළිතුරු ලියා තිබෙන්නට පිළිවන. එවැනි අවස්ථාවල දී සියලුම පිළිතුරු ලකුණු කොට අඩු ලකුණු ලබාගත් වැඩිපුර ලියා ඇති පිළිතුරු කපා හරින්න. කොටස් තුනෙන් නියමිත ප්‍රමාණය නොසලකා ලියා ඇති අවස්ථාවලදී ද එම පිළිතුරු කපා හරින්න. කපා හරින ලද පිළිතුරු සම්බන්ධයෙන් පහතින් සටහනක් යොදන්න. පිළිතුරු පත් පළමු ලකුණු කිරීම සඳහා රතුපාට පෑනක් භාවිත කිරීම අනිවාර්යය වේ.

## 1. පත්‍රය - චිත්‍ර කලාව

අභිමතාර්ථ :-

1 - ශ්‍රී ලංකාව, ඉංදියාව, යුරෝපය ආශ්‍රිත කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ ශිෂ්‍යයා අත්පත් කරගෙන ඇති නිපුණතා පිරික්සීම.

2 - විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.

3 - උගත් විෂය කරුණු නිරවුල්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ ☐ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = ☐ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

| | | |
|---|---|---|
| **චිත්‍ර කලාව I**<br>சித்திரக்கலை I<br>Art I | **51 S I** | **2018.08.08 / 0830 - 1140** |

| | |
|---|---|
| **පැය තුනයි**<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* | **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : .............................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.


**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

* **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත් එකට අමුණා භාර දෙන්න.

| **පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා** | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලැබූ ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| **1 වැනි පරීක්ෂක**<br>............ | **2 වැනි පරීක්ෂක**<br>............ |

## I කොටස

- ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **A, B, C, D, E** ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරෙන් තෝරන්න.



A B C D E

**1.** **A** අක්ෂරයෙන් දැක්වෙන මුරගල කැටයම
(1) අනුරපුර ශිල්පියාගේ නිර්මාණශීලීත්වය දැක්වෙන අගනා නිර්මාණයකි.
(2) කැටයම් ශිල්පයේ විවිධත්වය සංකල්පනාත්මක ව නිර්මාණය වූවකි.
(3) නා රජ ඇතුළු සංකේත කිහිපයක් ස්ථානගත කරමින් කළ නිර්මාණයකි.
(4) මුරගල් සංකල්පය ප්‍රකාශිත අනුරපුර යුගයේ බිහි වූ විශිෂ්ටතම මුරගලයි.
(5) විවිධ වස්තූන් සීමිත තලයක් තුළ රචනා කළ පුවරු කැටයමකි. (.........)

**2.** **B** අක්ෂරයෙන් දැක්වෙන දාරුමය පනේල කැටයම
(1) මානව රූ දෙකක් මනාව සම්පිණ්ඩනය කරමින් කළ නිර්මාණයකි.
(2) මල්ලවපොර සටන් නිරූපණය කෙරෙන අගනා කැටයමකි.
(3) පනාවිටිය අම්බලමේ දක්නට ලැබෙන මල්ලවපොර ප්‍රකාශිත කැටයමකි.
(4) ජීවන තොරතුරු දැක්වෙන ඇම්බැක්ක දේවාලයේ කැටයමකි.
(5) මල්ලවපොර නිර්මාණශීලීව කැටයමට යොදාගත් ඇම්බැක්ක දේවාලයේ නිර්මාණයකි. (.........)

**3.** **C** අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය
(1) ස්තූප ආශ්‍රයෙන් දක්නට ලැබෙන කැටයම් සහිත නිර්මාණයකි.
(2) අමරාවතී ලක්ෂණ පිළිබිඹු වන කැටයම් සහිත වාහල්කඩ නිර්මාණයකි.
(3) චෛත්‍යයේ සතර දිසාව දැක්වීම සඳහා යෙදූ නිර්මාණයකි.
(4) පුන්කලසින් මතුවන කල්පලතා සහිත කුලුණකි.
(5) චෛත්‍යයේ මල් ආසනය හා සම්බන්ධ කැටයමකි. (.........)

**4.** **D** අක්ෂරයෙන් දැක්වෙන වෘත්තාකාර ගල්පුවරුව
   (1) බුද්ධ චරිතයේ සිද්ධියක් කැටයමට නැගූ භාරුත් කැටයමකි.
   (2) බුද්ධ චරිතයේ සිද්ධියක් කැටයමට නැගූ අමරාවතී ශිල්පියාගේ නිර්මාණයකි.
   (3) වියරු වැටුණු ඇතකු පිළිබඳ පුවතක් කැටයමට නැගීමකි.
   (4) අමරාවතී චෛත්‍යයේ පුවරු කැටයම් අතුරෙන් එකකි.
   (5) සාංචි ස්ථූපයේ ස්ථම්භ කැටයම් අතර අගනා කැටයමකි. (.........)

**5.** **E** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්නයෙන් හමුවූ මුද්‍රාව තුළින් හැඟෙනුයේ
   (1) කෘෂිකාර්මික ඉන්දු නිම්න වැසියන් ගවයා ගෞරවයෙන් සැලකූ බව ය.
   (2) ගවයා සතුන් අතර පූජනීයත්වයෙන් සැලකූ බව ය.
   (3) එක් ජන ශ්‍රේණියක් හැඳින්වීමට ආභරණයක් ලෙස පැළඳි බව ය.
   (4) ඉන්දු නිම්න වැසියන් ගවයා පිදූ බවට ඉඟියක් ය.
   (5) ගව මුද්‍රා වෙළෙඳ භාණ්ඩයක් ලෙස භාවිත වන්නට ඇති බව ය. (.........)


- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි පිළිතුර** පහත 1 සිට 7 දක්වා නම් කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරු කරගෙන තෝරන්න.



1


2


3


4


5


6


7

**6.** මෙම සිත්තම් අතුරෙන් පැරණිම බෞද්ධ සිතුවම කුමක් ද?
   (1) 2    (2) 3    (3) 4    (4) 5    (5) 6    (.........)


**7.** මෙම සිතුවම් අතුරෙන් ලෙන් විහාර තුළ දක්නට ඇති සිතුවම් මොනවා ද?
   (1) 2, 3, 7    (2) 2, 5, 7    (3) 3, 5, 6    (4) 3, 5, 7    (5) 5, 6, 7    (.........)

**8.** මෙම සිතුවම් අතුරෙන් කපා සැකසූ ලෙන් තුළ ඇති සිතුවම කුමක් ද?
   (1) 2    (2) 3    (3) 4    (4) 5    (5) 7    (.........)

**9.** මෙම සිතුවම් අතුරෙන් එකම යුගයක නිර්මිත සිතුවම් ලෙස සැලකෙනුයේ මොනවා ද?
   (1) 1, 3, 4    (2) 1, 3, 5    (3) 2, 3, 5    (4) 3, 4, 5    (5) 3, 4, 6    (.........)

**10.** බාහිර ගල්බිත්තියේ දක්නට ඇති සිතුවම් මොනවා ද?
   (1) 2, 5    (2) 2, 6    (3) 3, 7    (4) 5, 6    (5) 6, 7    (.........)

- ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර K, L, M, N, O** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



K



L



M



N



O

**11.** **K** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම තුළින් සෝලියස් මැන්දිස්
(1) විහාර බිතු සිතුවම් කලාව වෙනසකට ලක් කර ඇත.
(2) බුදුන් වහන්සේගේ ලංකා ගමනය පිළිබඳ පුවතක් මනා සම්පිණ්ඩනයකින් යුතුව ප්‍රකාශ කරයි.
(3) බුදුන් වහන්සේ මහියංගණයට වැඩ යක්ෂයින් දමනය කළ අයුරු භාව පූර්ණ හැඩතල ඇසුරෙන් ප්‍රකාශ කරයි.
(4) ක්‍රියාකාරී මානව රුව හා විවිධ චරිත ලක්ෂණ පිළිබඳ හසල දැනුමක් ඇත්තකු බව දිස් වෙයි.
(5) යක්ෂයින්ගේ බියගුළු බව හා බුදුන් වහන්සේගේ ශාන්ත බව මනා සංයමයෙන් යුතුව පිළිබිඹු කරයි.
(.........)

**12.** **L** අක්ෂරයෙන් දැක්වෙන 'නිල් සාරිය' නම් වූ ආලේඛ්‍ය සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවු ද?
(1) ටියුඩර් රාජපක්ෂ (2) ඒ. සී. ජී. එස්. අමරසේකර
(3) හැරී පීරිස් (4) ජේ. ඩී. ඒ. පෙරේරා
(5) ජස්ටින් දැරණියගල
(.........)

**13.** **M** අක්ෂරයෙන් දැක්වෙන 'ලේනුන්ගෙන් පිරි හේනේ ගස' නම් වූ චිත්‍රය,
(1) සොබාදහමේ අසිරිය නිරූපණය කළ මෝගල් සිතුවමකි.
(2) ජෙහාන්ගීර් සමයේ බිහිවූ අබ්දුල් හසන් ශිල්පියාගේ සිතුවමකි.
(3) සොබාදහමේ සුන්දරත්වය චිත්‍රනය කළ මෝගල් ශිල්පි උස්තාද් මන්සූර්ගේ නිර්මාණයකි.
(4) සාජහාන් සමයේ මෝගල් ශිල්පායතනයේ බිහි වූ අගනා සිතුවමකි.
(5) රාජකීයයන්ගේ සිද්ධි නිරූපණයෙන් බැහැර වූ මෝගල් සිතුවමකි.
(.........)

**14.** **N** අක්ෂරයෙන් දැක්වෙන 'කාන්තාවන් තිදෙනා' නම් වූ චිත්‍රය,
(1) කාන්තාවන් පිළිබඳ කළ කාව්‍යමය දෘශ්‍ය ප්‍රකාශනයකි.
(2) කාන්තාවන් තිදෙනෙකුගේ රූ මනාව සම්පිණ්ඩනය කළ ශෛලීගත නිර්මාණයකි.
(3) ස්වාභාවිකත්වය හා කල්පිතය කැටි කළ ජෙමිනි රෝයිගේ නිර්මාණයකි.
(4) ආගමික වතාවත්වල යෙදෙන කාන්තාවන් තිදෙනෙකු දැක්වෙන තාගෝර්ගේ නිර්මාණයකි.
(5) රේඛාවට මුල් තැන දෙමින් සැරසිලි මාධ්‍යය සංයමයෙන් යොදාගත් ජෙමිනි රෝයිගේ සිතුවමකි. (.........)

**15.** **O** අක්ෂරයෙන් දැක්වෙන 'මම සහ මගේ ගම' නම් වූ චිත්‍රය,
(1) අධිතාත්ත්විකවාදී මාර්ක් චාගල්ගේ මනඃකල්පිත සිතුවිල්ලක ප්‍රතිඵලයකි.
(2) සිහින ලොවේ මූල ධාතුන් මනසින් දැකීමට ගත් උත්සාහයකි.
(3) සැල්වඩෝර් ඩාලිගේ උපවිඥානයේ පහලවන සිහිනමය සිතුවිල්ලකි.
(4) මනසේ සැඟවුනු සිතුවිල්ලක් චිත්‍රනය කළ පෝල් ක්ලීගේ සිතුවමකි.
(5) යථාර්ථයේ හා විකෘතියේ සංකලනයකින් චිත්‍රයට නැගූ ජෝන් මීරෝගේ සිතුවමකි.
(.........)

● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.



F G H I J

**16.** **F** අක්ෂරයෙන් හඳුන්වන මෙම පිළිමය
(1) ආධ්‍යාත්මික ගුණ පිළිබිඹු කරවන ගල් විහාරයේ බුදු පිළිමයකි.
(2) පොළොන්නරුවේ ඇති සුවිශේෂ ලක්ෂණ සහිත බුදු පිළිමයකි.
(3) ගල්විහාර පිළිමවල ඇති ලක්ෂණ පිළිබිඹු කරවන බුදු පිළිමයකි.
(4) අනුරාධපුර සමාධි බුදු පිළිමයට බෙහෙවින් සමාන පොළොන්නරුවේ බුදු පිළිමයකි.
(5) හිසකෙස් හා සිවුර අතිශය සරලව නිරූපිත පොළොන්නරුවේ බුදු පිළිමයකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන ලෝකඩ මූර්තිය
(1) ත්‍රිකුණාමලයෙන් හමුවී ඇති ලෝකඩ මූර්තියකි.
(2) කෝනේශ්වරම් කෝවිලේ දක්නට ඇති මූර්තියකි.
(3) චෝල පාලන සමයට අයත් දකුණු ඉන්දීය මූර්තියකි.
(4) ශිව දෙවියන්ගේ පතිනිය වන පාර්වතීගේ මූර්තියකි.
(5) ඉෂාර මුදියර් දැක්වෙන හින්දු ලෝකඩ මූර්තියකි. (.........)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය පිළිමය
(1) සාරානාත් ගුරුකුලයට අයත් මූර්තියකි.
(2) කැටයම් සහිත ප්‍රභාමණ්ඩලයකින් යුතු පිළිමයකි.
(3) ආධ්‍යාත්මික ලක්ෂණ නිරූපිත සාරානාත් පිළිමයයි.
(4) ආධ්‍යාත්මික ලක්ෂණ මනාව පිළිබිඹු කෙරෙන අගනා මූර්තියකි.
(5) දම් දෙසන අයුරු නිරූපිත බුද්ධ ප්‍රතිමාවකි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන මිසර මූර්තිය
(1) දේවත්වය ආරූඪ කර ඇති රාජකීය පාරා රජෙකුගේ පිළිරුවකි.
(2) සාම්ප්‍රදායික සහ ස්වාභාවික ලක්ෂණ නිරූපිත පිළිරුවකි.
(3) පැරණි රාජධානි යුගයට අයත් කාෆ්රේ ප්‍රතිමාවයි.
(4) පැරණි රාජධානි යුගයට අයත් ඇඳුම් හා හිස්වැස්ම සහිත මූර්තියයි.
(5) යටි රැවුල දක්වා තිබීම නිසා මිසර මූර්ති අතර සුවිශේෂී මූර්තියකි. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය
(1) ලන්ඩනයේ ටේට් ගැලරියේ දක්නට ඇති උඩුකය මූර්තියකි.
(2) ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද නරපතියකුගේ පිළිරුවකි.
(3) ප්‍රතාපවත් අධිරාජ්‍යයෙකු නිරූපිත රෝම උඩුකය මූර්තියකි.
(4) ස්වාභාවික පරිමාණයෙන් යුතු ග්‍රීක උඩුකය මූර්තියකි.
(5) හෙලනිස්ටික් යුගයේ නිර්මිත ලෝකඩ උඩුකය මූර්තියකි. (.........)

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**21.** නිෂ්පාදිත භාණ්ඩයක් හඳුන්වා දීම සඳහා නිර්මාණය කෙරෙන පෝස්ටරයක වඩාත් වැදගත් වන්නේ,
(1) රූප හා වර්ණ සංකේතාත්මකව භාවිත කිරීමයි.
(2) තේමාවට ගැළපෙන කෙටි පාඨයක් භාවිත කිරීමයි.
(3) අරමුණ සරලව, නිරවුල්ව, අර්ථාන්විතව හා වේගවත්ව ප්‍රකාශ කිරීමයි.
(4) සංකේත රූපසටහන් තලය හා අවකාශයට ගැළපෙන සේ සැලසුම් කිරීමයි.
(5) මනා නිමාවකින් විචිත්‍රවත්ව නිර්මාණය කිරීමයි. (.........)

**22.** චිත්‍ර ශිල්පියකු සිතුවමක් වර්ණ ගැන්වීමේදී අවධාරණය කරනුයේ,
(1) චිත්‍රයේ සිත්කළු බවයි. (2) තේමාව මතු කර දැක්වීමයි.
(3) ශිල්ප ක්‍රම භාවිතයයි. (4) තමාට ආවේණික ශෛලියයි.
(5) වස්තූන්ගේ ස්වභාවයන් පෙන්වීමයි. (.........)


**23.** උපස්ථිතිවාදී ව්‍යාපාරය ගොඩනැගීමේ මූලික අපේක්ෂාව වූයේ,
(1) සොබාදහම පිළිබඳ යථාර්තය තත්වාකාරයෙන් වර්ණ මාධ්‍යයෙන් මතු කිරීමයි.
(2) වස්තූන්ගේ විවිධත්වය නිරීක්ෂණය කර සත්‍ය ප්‍රකාශ කිරීමයි.
(3) වස්තූන් මත පතිත වන ආලෝකය හා ඉන් ඇතිවන විපර්යාස අධ්‍යයනය කිරීමයි.
(4) සැබෑ ලෝකයේ වස්තූන්ගේ ස්වභාවය ඒ අයුරින්ම ප්‍රකාශ කිරීමයි.
(5) සීමිත වර්ණමාලාවක් තුළින් සත්‍ය ස්වභාවය ප්‍රකාශ කිරීමයි. (.........)

**24.** '43 කණ්ඩායම' බිහිකරලීමේ දී, පුරෝගාමී ශිල්පීන්ගේ අරමුණ වූයේ,
(1) සම්භාව්‍ය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාව ප්‍රචලිත කරලීමයි.
(2) තත්කාලීන බටහිර ශිල්පීන්ගේ ක්‍රම ශිල්ප මෙරටට හඳුන්වා දීමයි.
(3) ස්වාධීනව නව නිර්මාණ බිහි කිරීම හා චිත්‍ර කලාවට නව අරුතක් දීමයි.
(4) සම්ප්‍රදාය රැකිමින් සිද්ධාන්ත මත පිහිටා සිතුවම් කිරීමට ඉඩ සැලසීමයි.
(5) නවක ශිල්පීන් දේශීය චිත්‍ර කලාවට නැඹුරු කිරීමයි. (.........)

**25.** සැබෑ ලොවත් සිහින ලොවත් එකට කැටි වූ ස්වරූපය වඩාත් සුලබව දක්නට ලැබෙනුයේ,
(1) අධි තාත්ත්විකවාදය තුළිනි. (2) ඝනිකවාදය තුළිනි.
(3) උපස්ථිතිවාදය තුළිනි. (4) අමූර්තවාදය තුළිනි.
(5) පශ්චාත් උපස්ථිතිවාදය තුළිනි. (.........)

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට, ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**26.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,
(1) ථූපාරාම වටදාගෙයයි.
(2) ලංකාරාම වටදාගෙයයි.
(3) තිරියාය වටදාගෙයයි.
(4) අම්බස්තල වටදාගෙයයි.
(5) මැදිරිගිරිය වටදාගෙයයි.



(.........)

**27.** දඹදෙණි යුගයට අයත් මෙම නිර්මාණය,
(1) කලු ගලින් තනන ලද පියගැට පෙළ සහිත පිවිසුම් දොරටුවකි.
(2) යාපහුවේ නටබුන් හා සම්බන්ධ පිවිසුම් දොරටුවයි.
(3) ගලින් කරන ලද කැටයම් සහිත උළුවස්සකි.
(4) චෝල නිර්මාණ ශිල්පය අනුව නිමවූ යාපහු රාජධානියේ වාහල්කඩයි.
(5) යාපහු දළදා මැදුර අභියස ඇති පිවිසුම් දොරටුවයි.



(.........)

**28.** පංච පාණ්ඩව රථ දේවාලයට අයත් මෙය,
(1) කොටස් තුනකින් යුතු පිරමීඩාකාර දෙවොලකි.
(2) ඉතා කුඩා ද්‍රවුපදීරාත් දෙවොලයි.
(3) වෙනමම ගලකින් නෙළන ලද සහදේවරාත් දෙවොලයි.
(4) සරල හැඩයකින් යුතු භීමාරාත් දෙවොලයි.
(5) පිරමීඩාකාර වහල සහිත ධර්මරාජරාත් දෙවොලයි.



(.........)


**29.** මෙහි දැක්වෙන ශාන්ත ඩෙනිස් දෙවොල,



(1) රාජකීයයන්ගේ භූමදාන උදෙසා තනන ලද දෙවොලකි.
(2) බොකු වහලින් යුතු කුලුනු සහිත දෙවොලකි.
(3) හෝරස් දෙවියන් උදෙසා කැප කරන ලද දෙවොලකි.
(4) රාජකීයයන් උදෙසා ඉදිකරන ලද තෙමහල් දෙවොලකි.
(5) ගොතික් ශිල්ප ක්‍රම අනුව පැරිසියේ ඉදිවූ විශාලතම දෙවොලයි.

(.........)

**30.** මෙහි දැක්වෙන ඕවලාකාර ගොඩනැගිල්ල,



(1) රංග භූමියක් මැදිවන සේ තනන ලද තුන්මහල් මන්දිරයකි.
(2) සතුන් සහ මිනිසුන් අතර සටන් නැරඹීම සඳහා යොදාගත් විනෝද රංග භූමියකි.
(3) රාජකීයයන්ගේ ගෘහස්ථ ප්‍රේක්ෂකාගාරයකි.
(4) වහලක් නොමැතිව නිර්මාණය කළ රාජකීයයන්ගේ එළිමහන් ප්‍රේක්ෂකාගාරයකි.
(5) බැවුම් සහිතව වෘත්තාකාරව සැකසුන පඩිපෙළිවලින් යුතු රංග භූමියක් සහිත ඕවලාකාර තෙමහල් මන්දිරයකි.

(.........)

● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**31.** ශ්‍රී ලංකාවේ හා යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම් සැසඳීමේ දී යුරෝපයේ ලෙන් සිතුවම් නිර්මාණය පිළිබඳ විශේෂත්වය වනුයේ,
(1) අඳුරු ලෙන් තුළ සිතුවම් වීමයි.
(2) වර්ණ වැඩි සංඛ්‍යාවක් භාවිත කිරීමයි.
(3) ප්‍රාථමික ස්වරූපයේ හැඩතල නිරූපණය වීමයි.
(4) තාත්ත්විකත්වයට සමීපව නිරූපණය වීමයි.
(5) විවිධ වර්ගයේ රූප එකට ගොනුවී තිබීමයි. (.........)

**32.** පුනර්ජීවන යුගයේ ශිල්පීන් චිත්‍ර හා මූර්ති කලාවේ විශිෂ්ටයන් වූයේ,
(1) අභ්‍යාස තුළින් ප්‍රායෝගික හැකියා වර්ධනය කරගැනීම තුළිනි.
(2) සිද්ධාන්ත නිවැරදිව ප්‍රකාශ කිරීම තුළිනි.
(3) මානව සිරුර පිළිබඳ මනාව අධ්‍යයනය කිරීම තුළිනි.
(4) ග්‍රීක කලාවේ ආභාසය ලැබීම තුළිනි.
(5) මානව රුව තාත්ත්විකව හා ප්‍රකාශනාත්මකව හැසිරවීම තුළිනි. (.........)

**33.** මහනුවර යුගයේ විහාර සිතුවම් සම්ප්‍රදාය පහතරට ප්‍රදේශ කරා ව්‍යාප්ත වීමේ දී දක්නට ඇති කැපී පෙනෙන ලක්ෂණය වනුයේ,
(1) පසුතලය නිල් හෝ කළු වර්ණයෙන් යුක්ත වීමයි.
(2) සවිස්තරාත්මක බව හා ගස්වැල් ස්වභාවික ලෙස නිරූපණය වීමයි.
(3) චරිත කථා බහුල වශයෙන් නිරූපණය වීමයි.
(4) මානව රුව ප්‍රමාණයෙන් විශාල වීමයි.
(5) සමාජයීය තොරතුරු බහුලව නිරූපණය වීමයි. (.........)

**34.** භාරූත් ගල්වැටේ ගල් පුවරු කැටයම් තුළින් බහුලව නිරූපණය වනුයේ,
(1) බුද්ධ චරිතයේ සිද්ධීන් ය.
(2) ජාතක කථා සිද්ධීන් ය.
(3) ඓතිහාසික සිද්ධීන් ය.
(4) බෝසතුන් සතුන් සේ දැක්වෙන ජාතක කතා පුවත් ය.
(5) මානව රුව බහුලව යොදා ගත් සිද්ධීන් ය. (.........)

**35.** මිසර නවරාජධානි යුගයේ මූර්ති තුළින් බෙහෙවින් කැපී පෙනෙනුයේ,
(1) සාම්ප්‍රදායික ලක්ෂණ බහුලව යෙදීමයි.
(2) සාම්ප්‍රදායික හා ස්වභාවික ලක්ෂණ සමව යෙදීමයි.
(3) ස්වභාවික ලක්ෂණ අවධාරණයෙන් නිරූපණය කිරීමයි.
(4) සාම්ප්‍රදායික ලක්ෂණ නොසලකා හැරීමයි.
(5) පාරාවරුන්ගේ බලමහිමය නිරූපණයයි. (.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම උපුටා ගන්නා ලද්දේ,
(1) කැලණි විහාරයෙනි. (2) බොරැල්ල ගෝතමී විහාරයෙනි.
(3) බෙල්ලන්විල විහාරයෙනි. (4) මාලිගාකන්ද විහාරයෙනි.
(5) සේදවත්ත විහාරයෙනි. (.........)

**37.** මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ,
(1) විදේශ ආභාසය මත සිතුවම්කරණයේ යෙදුන ඇම්. සාර්ලිස් ශිල්පියා විසිනි.
(2) දේශීය සම්ප්‍රදායන් ගරු කළ සෝලියස් මැන්දිස් ශිල්පියා විසිනි.
(3) විහාර චිත්‍ර කලාව නව මගකට යොමු කළ ජෝර්ජ් කීට් ශිල්පියා විසිනි.
(4) නව ආරක චිත්‍ර සම්ප්‍රදායක් ගොඩනගාගත් සෝමබන්දු විද්‍යාපති ශිල්පියා විසිනි.
(5) විහාර චිත්‍ර කලාවට දායක වූ මංජු ශ්‍රී විසිනි. (.........)

**38.** මෙම සිතුවමෙහි තේමාව වන්නේ සිදුහත් කුමරුගේ කවර අවස්ථාව ද?
(1) විවාහ ගිවිස ගැනීම (2) සරණ මංගල්‍යය
(3) ගිහි ජීවිතය (4) යසෝදරා හමුවීම
(5) යසෝදරාගේ මාලිගයට ගිය අවස්ථාව (.........)

**39.** මෙම සිතුවම තුළින් ශිල්පියා
(1) මානව රුවේ හා වස්තූන්ගේ ස්වාභාවික ආකෘතිය තත්ත්වාකාරයෙන් භාවිතයට ගෙන ඇත.
(2) ස්වාභාවික මානව රුවේ මූලාකෘතිය කිසියම් ශෛලියකට අනුව හසුරුවා ඇත.
(3) ප්‍රකාශනයේ ආකෘතිය රංග කලාවේ මූලික ඉරියව්වලට අනුව හසුරුවා ඇත.
(4) සජීවී වස්තූන්ගේ චලනය ශෛලිගත සම්ප්‍රදායකට අනුව හසුරුවා ඇත.
(5) මානව රුව නිවැරදි මාන ප්‍රමාණයන්ගෙන් යුතුව රචනා කර ඇත. (.........)

**40.** මෙම සිතුවම පිළිබඳ වඩාත්ම ගැළපෙන ප්‍රකාශය කුමක් ද?
(1) මනා සංයමයෙන් යුතුව කර ඇති රූප හා වර්ණ භාවිතය අතිශයින්ම භාවාත්මක ය.
(2) හැඟීම් ප්‍රකාශය කෙරෙහි මහත් වෙහෙසක් දරා ඇත.
(3) සංරචනය තුළින් තේමාවට සාධාරණයක් ඉටු කර ඇත.
(4) විහාර චිත්‍ර කලාවට උචිත නව චිත්‍ර ආරක් හඳුන්වා දීමට සමත්ව ඇත.
(5) ආගමික තේමාවකට ගැළපෙන වර්ණ රටාවක් භාවිත කොට ඇත. (.........)

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: **51**

විෂයය / பாடம்: **චිත්‍ර කලාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 4 |
| 02. | 5 | 12. | 1 | 22. | 2 | 32. | 5 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 1 |
| 04. | 2 | 14. | 5 | 24. | 2 | 34. | 4 |
| 05. | 1 | 15. | 1 | 25. | 1 | 35. | 4 |
| 06. | 5 | 16. | 5 | 26. | 3 | 36. | 3 |
| 07. | 4 | 17. | 4 | 27. | 5 | 37. | 4 |
| 08. | 2 | 18. | 3 | 28. | 2 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 5 | 39. | 2 |
| 10. | 2 | 20. | 3 | 30. | 5 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

## 'අ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** ශ්‍රී ලංකාවේ පැවති චිත්‍ර කලාව නූතන යුගය වන විට විවිධ ආභාසයන්ගෙන් පෝෂණය වෙමින් නව මංපෙත් ඔස්සේ ව්‍යාප්ත විය.

(i) ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවට යොමු වූ ආලේඛ්‍ය චිත්‍ර ශිල්පීන් **හතර දෙනකු** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ භාවපූර්ණ නිර්මාණකරණය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඩේවිඩ් පේන්ටර් හා ජෝර්ජ් කීට් ශිල්පීන්ගෙන් ආගමික සිතුවම් කලාවට සිදු වූ මෙහෙය පිළිබඳ සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 10 යි.)

(i)
- A.C.G.S. අමරසේකර
- ඩේවිඩ් පේන්ටර්
- J.D.A. පෙරේරා
- හැරී පීරිස්
- ටියුඩර් රාජපක්ෂ

(ii) දේශීය හා විදේශීය කලා අධ්‍යාපනය හදාරා තමාටම ආවේනික වූ ශෛලියක් ගොඩනගා ගත් ශිල්පියෙකි. දේශීයව හා ජාත්‍යන්තරව සම්මාන ලැබූ ශිල්පියෙකි.

මොහුගේ භාව පූර්ණ නිර්මාණකරණයේ ලක්ෂණ ලෙස .......

- මොහු චිත්‍රය හඳුවන්නේ, යම් අදහසක් සිතට ආ විට එය හැඩයෙන් හා වර්ණයෙන් කැන්වසය මත සටහන් කිරීමෙනි. එය ආධ්‍යාත්මයේ පහලවන සිතුවිලි නවමු ආකාරයෙන් නිරූපණයට දැරූ උත්සාහයකි.
- වර්ණයේ සහ හැඩයේ සමබරතාවය රකිමින් වේගවත් පින්සල් පහර තලය මත හසුරවන්නෙකි.
- උපස්ථිතිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී හා සනරූපී කලා ආරයන්ගේ යම් යම් ආභාසයන් සිතුවම් තුළ දැකිය හැකියි.
- නිරූපණයේදී සරල ජ්‍යාමිතික හැඩතල හා විවිධ වර්ණ ශක්තීන් හා සංගත වර්ණමාලාවක් යොදා ගැනීම කැපී පෙනෙන ලක්ෂණයකි.
- ආත්ම සංයමයකින් නිමවූ ඔහුගේ කෘතීන් තුළින් භාවමය රස පිළිබිඹු කරවයි.
- සඳපායා, මල් සුවඳ, ගඟට වැසි වසී, චන්ද්‍රකාන්ත පාෂාණය, රිද්මය, යුවල වැනි නිර්මාණවල ඉහත දැක්වූ කලා ලක්ෂණ පිළිබිඹු වේ.

(iii) ඩේවිඩ් පේන්ටර් හා ජෝර්ජ් කීට් ආගමික සිතුවම් කලාව නව මංපෙතකට යොමුකල ශිල්පීන් දෙදෙනෙකි. ජෝර්ජ් කීට් ශිල්පියා බොරැල්ලේ ගෝතමී විහාර සිතුවම්කරණයෙන් ද ඩේවිඩ් පේන්ටර් මහනුවර ත්‍රිත්ව විද්‍යාලීය සිතුවම් නිර්මාණයෙන් ද ආගමික සිතුවම් කලාවට ප්‍රශස්ථ මෙහෙයක් සිදු කළේය. ජෝර්ජ් කීට්, බුද්ධ චරිතයේ ද, ඩේවිඩ් පේන්ටර් ක්‍රිස්තු චරිතයේ සිද්ධීන් ද නිර්මාණය කිරීම තුළින්, පොදු ජනයා තුල ආගමික ප්‍රබෝධයක් ඇති කරවීමට සමත්විය. සිතුවම් නිර්මාණයේදී ඔවුන් භාවිත කල ශෛලීය, රේඛාකරණය, වර්ණ - හැඩතල ඒ සඳහා හේතුපාදක විය.

ජෝර්ජ් කීට් ගේ ගෝතමී විහාර සිතුවම්

- විහාර සිතුවම් කලාවේ පෙරළියක් කල නවතම නිරූපණ විලාසයක් ඉදිරිපත් වීම.
- දේවාරාධනයේ සිට පරිනිර්වාණය දක්වා වූ වැදගත් සිදුවීම් තේමා විය.
- බටහිර තාත්වික කලා සම්ප්‍රදායක් ප්‍රචලිතව පැවති සමයක දේශීය සිතුවම් කලාවේ, යම් යම් ලක්‍ෂණ ගුරුකොට බුද්ධි ගෝචරව නව විලාසයකින් සිතුවම් වීම.
- මහනුවර යුගයේ සිතුවම් හි භාවිත වූ අඛණ්ඩ කථන විලාසය නව මුහුණුවරකින් යොදා ගැනීම.
- තලය පිරී යන සේ හැසිර වූ මානව රූප, සරල ප්‍රාණවත් රේඛාවෙන් මතු කිරීම.
- රූප රාමු වෙන් නොකොට සිදුවීම් දාමයක් ලෙස එක දිගට දිග හැරෙන අයුරින් සිද්ධි නිරූපණය වීම.
- තලය පිරීයන සේ හැසිර වූ මානව රූප සරල ප්‍රාණවත් රේඛාවෙන් මතු කිරීම.
- සියලු රූපවල විස්තර කෙටි රේඛා හැසිරවීමෙන් ඒවායේ ගති ලක්‍ෂණ නිරූපණය වීම.
- විසිතුරු තද පැහැ වර්ණ මාලාවක් යෙදීම.
- ත්‍රිමාණ ලක්‍ෂණ මෙන් ම ද්විමාන ලක්‍ෂණ වර්ණ තුළින් මතු කිරීම.
- සියුම් වර්ණ ප්‍රභේද භාවිතයෙන් තොරවීම.
- භාව ප්‍රකාශනය තීව්‍ර කිරීම සඳහා මාරයන්ගේ මුහුණ වියුක්ත රූපීව දැක්වීම.
- ශ්‍රද්ධාව, භක්තිය වැනි දැහැමි හැඟීම් ජනිත කිරීම මෙන් ම ශෘංගාරාත්මක රසයක් ඇති කරවන බව ඇතමුන්ගේ අදහසකි.

ඩේවිඩ් පෙන්ටර්ගේ ත්‍රිත්ව දෙව් මැදුරේ සිතුවම්

- ක්‍රිස්තු චරිතයේ සිද්ධීන් වන ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීම, යහපත් සැමරිටානුවා, පාද දෝවනය, විශිෂ්ඨත්වයට පැමිණීම වැනි සිද්ධීන් නිරූපිතය.
- යුරෝපීය ශාස්ත්‍රාලයීය කලා සම්ප්‍රදාය අනුගමනයෙන් තාත්විකව නිරූපණය කිරීම.
- තාත්වික මානව රූපයන්හි දේශීය ලක්‍ෂණ මතු වී පෙනේ.
- අවට පරිසරයෙන් තෝරාගත් පුද්ගලයින්, දේශීය ඇඳුම් මෙන් ම දේශීය පරිසරය නිරූපනය කැපී පෙනෙන ලක්‍ෂණයකි.
- මානව රූපයේ ඉරියව් තුළින් භාව ප්‍රකාශනය ඉස්මතු කර ඇත.
- වර්ණයන්ගේ පැහැපත් බව, සියුම් ප්‍රභේදකරණය, සිත් අලවන සුළු ලක්‍ෂණයකි. එයින් ප්‍රකාශනයේ තීව්‍ර බව රැකී ඇත.
- වර්ණ හැසිරවීම ද මනා සංයමයකින් යුතුව කර ඇත.
- සාම්ප්‍රදායික ක්‍රිස්තු චරිතය තම චිත්‍ර තුළින් ප්‍රකාශ නොවුව ද ඒ තුළින් මතුවන කිතුදහමේ සංකල්පයන්ගේ කිසිදු අඩුවක් වී නොමැත.

මෙම කරුණු සංසන්දනාත්මකව ලිවීම අපේක්‍ෂා කෙරේ.

**2.** අනුරාධපුර යුගයේ පැවති බුදුපිළිම නිර්මාණ කලාව පොළොන්නරුව යුගය වන විට සුවිශේෂී ලක්ෂණ සහිත ව නිර්මාණකරණය කිරීමට ශිල්පියා යොමු විය.

(i) අනුරාධපුර යුගයේ ඉදි කළ හිඳි පිළිම **දෙකක්** හා හිටි පිළිම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) අනුරපුර යුගයේ බුදු පිළිමවල දක්නට ලැබෙන සුවිශේෂී නිර්මාණ ලක්ෂණ කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 06 යි.)

(iii) පොළොන්නරු ගල් විහාර පිළිම කෙරෙහි මහායාන තන්ත්‍රයානය බලපා ඇති අයුරු ගල් විහාරයේ පළමු සමාධි පිළිමය ඇසුරෙන් පහදන්න. (ලකුණු 10 යි.)

(i) අනුරාධපුර යුගයේ

හිඳි පිළිම

- මහමෙව්නා උයනේ සමාධි බුදු පිළිමය
- තොලුවිල බුදු පිළිමය
- පන්කුළිය බුදු පිළිමය (අශෝකාරාමය)

අනුරාධපුර යුගයේ

හිටි පිළිම

- අවුකන බුදු පිළිමය
- සැස්සේරුව බුදු පිළිමය (රැස්වෙහෙර පිළිමය)
- මාළිගාවිල බුදු පිළිමය
- මහ ඉලුප්පල්ලම බුදු පිළිමය
- බුදුරුවගල බුදු පිළිමය

(ii) අනුරාධපුර යුගයේ බුදු පිළිමවල දැකිය හැකි සුවිශේෂී නිර්මාණ ලක්ෂණ

- ශිල්ප ක්‍රම -
  නෙලීම - ඇඹීම - වාත්තු කිරීම (ආබද්ධ / අනාබද්ධ)
- හිඳි පිළිම - වීරාසන ක්‍රමය, ඒකාංශ කොට චීවරය දැක්වීම හා රැලි රහිත වීම, ධ්‍යාන මුද්‍රාව ප්‍රචලිතව තිබූ බව (උදා - සමාධි - තොලුවිල)
- හිඳි පිළිම නිර්මාණයට ගුප්ත කලා සම්ප්‍රදාය අනුගමනය වීම.
- පන්කුළිය හිඳි පිළිමයේ දෑතින් මුද්‍රා දැක්වීම විශේෂත්වයකි.
- කුණ්ඩලාකාර හිසකේ සහ ළඹ සවන් පොදු ලක්ෂණයන්ය.
- සුවිශේෂිත ලක්ෂණය වන්නේ, භාව ප්‍රකාශනයයි.
- හිටි පිළිම නිර්මාණයේ දී බෙහෙවින් (ආන්ද්‍ර) අමරාවතී කලා සම්ප්‍රදාය බලපා ඇත.
- අවුකන පිළිමය ආබද්ධ පිළිමයකි. අමරාවතී කලා ආභාසය දැක්වේ. අභය මුද්‍රාව නිරූපිතය. චීවරය රැලි සහිතය. සැස්සේරුව බුදු පිළිමය භාහිර ලක්ෂණ අතින් බොහෝ දුරට මේ පිළිමයට සමානය.
- මහ ඉලුප්පල්ලම හිටි පිළිමය අනාබද්ධ පිළිමයකි. අභය මුද්‍රාව හා චීවරයේ රැලි සහිත බව නිරූපිතය.

(iii) පොළොන්නරු ගල් විහාර බුදු පිළිම කෙරෙහි මහායාන තන්ත්‍රයානය බලපා ඇති අයුරු -
ගල්විහාරයේ පළමු සමාධි පිළිමය -

- වජ්‍රාසනයක් මත පිළිමය වැඩ සිටින අයුරින් නෙළා ඇත.
- මහායානිකයින් අතර ප්‍රචලිත වූ වජ්‍ර සංකේතය එම ආසනයේ යොදා ඇත.
- පිළිමය පිටුපස කැටයම් සමූහය ඉන්දීය පාලසේන යුගයේ මහායාන බලපෑම් අනුව බුදුපිළිම ආශ්‍රිතව යෙදීම.
- හරස් පටි තුනක් සහිත තොරණ යෙදීම.
- අශ්ව ලාඩමක හැඩය රැස් මාලාව හා කේතු මාලාව යෙදීම.
- ධ්‍යාන බුදු රූ සහිත විමාන හතරක් පසුබිමේ දක්නට ලැබීම.
- මහායාන තාන්ත්‍රයානික ග්‍රන්ථයක් වූ "සාධනමාලා" ග්‍රන්ථයේ හැඳින්වෙන පරිදි වෛරෝචන, ආක්ෂෝභය, රත්න සම්භව අමිතාභ, අමෝඝ සිද්ධි යන ධ්‍යානි බුද්ධ මණ්ඩලය මෙම විමාන තුලින් මූර්තිමත් කෙරෙන බව පිළිගැනේ.
- මේ අනුව බෝධිසත්ව සංකල්පය නිරූපණය කිරීමට ගල්විහාර ශිල්පියා උත්සාහ ගෙන ඇති බව පෙනේ.

## 'ආ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**3.** මෞර්ය යුගයෙන් ඇරඹි බෞද්ධ කලාව පසු කාලීන සමස්ත ඉන්දීය කලාවන් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරවීමට සමත් විය.

(i) මෞර්ය යුගයේ ඉදිවූ බෞද්ධ ස්මාරක **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) භාරුත් ශිල්පියා චෛත්‍ය වටා ඉදි කළ ගල් වැටෙහි නිර්මාණ ආකෘතිය කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි.)

(iii) සාංචි තොරණ කැටයම් ශිල්පියාට බුද්ධ චරිතයේ සිද්ධීන් මෙන්ම ජාතක කතාද තම නිර්මාණ සඳහා පාදක විය. එම කැටයම්වල කලා ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(i)
- ★ ලෞරියා නන්දන්ගර් ස්ථම්භය
- ★ රාම්පූර්වා ස්ථම්භය
- ★ රුම්න්දෙයි ස්ථම්භය
- ★ සාරානාත් ස්ථම්භ ශීර්ෂය
- ★ සාංචි ස්ථම්භ ශීර්ෂය
- ★ බෂාර් බඛීරා ස්ථම්භය
- ★ නිග්ලිව ස්ථම්භය
- ★ සංකස්ස ස්ථම්භය
- ★ දිල්ලි තෝප්රා ස්ථම්භය
- ★ දිල්ලි මිරාට් ස්ථම්භය
- ★ කොල්හුවා ස්ථම්භය
- ★ ලෞරියා අරරාජ් ස්ථම්භය

**2.** අනුරාධපුර යුගයේ පැවති බුදුපිළිම නිර්මාණ කලාව පොළොන්නරුව යුගය වන විට සුවිශේෂී ලක්ෂණ සහිත ව නිර්මාණකරණය කිරීමට ශිල්පියා යොමු විය.

(i) අනුරාධපුර යුගයේ ඉදි කළ හිඳි පිළිම **දෙකක්** හා හිටි පිළිම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) අනුරපුර යුගයේ බුදු පිළිමවල දක්නට ලැබෙන සුවිශේෂී නිර්මාණ ලක්ෂණ කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 06 යි.)

(iii) පොළොන්නරු ගල් විහාර පිළිම කෙරෙහි මහායාන තන්ත්‍රයානය බලපා ඇති අයුරු ගල් විහාරයේ පළමු සමාධි පිළිමය ඇසුරෙන් පහදන්න. (ලකුණු 10 යි.)

(i) අනුරාධපුර යුගයේ

හිඳි පිළිම

- මහමෙව්නා උයනේ සමාධි බුදු පිළිමය
- තොලුවිල බුදු පිළිමය
- පන්කුළිය බුදු පිළිමය (අශෝකාරාමය)

අනුරාධපුර යුගයේ

හිටි පිළිම

- අවුකන බුදු පිළිමය
- සැස්සේරුව බුදු පිළිමය (රැස්වෙහෙර පිළිමය)
- මාළිගාවිල බුදු පිළිමය
- මහ ඉලුප්පල්ලම බුදු පිළිමය
- බුදුරුවගල බුදු පිළිමය

(ii) අනුරාධපුර යුගයේ බුදු පිළිමවල දැකිය හැකි සුවිශේෂී නිර්මාණ ලක්ෂණ

- ශිල්ප ක්‍රම -
  නෙළීම - ඇඹීම - වාත්තු කිරීම (ආබද්ධ / අනාබද්ධ)
- හිඳි පිළිම - වීරාසන ක්‍රමය, ඒකාංශ කොට චීවරය දැක්වීම හා රැලි රහිත වීම, ධ්‍යාන මුද්‍රාව ප්‍රචලිතව තිබූ බව (උදා - සමාධි - තොලුවිල)
- හිඳි පිළිම නිර්මාණයට ගුප්ත කලා සම්ප්‍රදාය අනුගමනය වීම.
- පන්කුළිය හිඳි පිළිමයේ දෑතින් මුද්‍රා දැක්වීම විශේෂත්වයකි.
- කුණ්ඩලාකාර හිසකේ සහ ළඹ සවන් පොදු ලක්ෂණයන්ය.
- සුවිශේෂිත ලක්ෂණය වන්නේ, භාව ප්‍රකාශනයයි.
- හිටි පිළිම නිර්මාණයේ දී බෙහෙවින් (ආන්ද්‍ර) අමරාවතී කලා සම්ප්‍රදාය බලපා ඇත.
- අවුකන පිළිමය ආබද්ධ පිළිමයකි. අමරාවතී කලා ආභාසය දැක්වේ. අභය මුද්‍රාව නිරූපිතය. චීවරය රැලි සහිතය. සැස්සේරුව බුදු පිළිමය භාහිර ලක්ෂණ අතින් බොහෝ දුරට මේ පිළිමයට සමානය.
- මහ ඉලුප්පල්ලම හිටි පිළිමය අනාබද්ධ පිළිමයකි. අභය මුද්‍රාව හා චීවරයේ රැලි සහිත බව නිරූපිතය.

(iii) පොළොන්නරු ගල් විහාර බුදු පිළිම කෙරෙහි මහායාන තන්ත්‍රයානය බලපා ඇති අයුරු -
ගල්විහාරයේ පළමු සමාධි පිළිමය -

- වජ්‍රාසනයක් මත පිළිමය වැඩ සිටින අයුරින් නෙළා ඇත.
- මහායානිකයින් අතර ප්‍රචලිත වූ වජ්‍ර සංකේතය එම ආසනයේ යොදා ඇත.
- පිළිමය පිටුපස කැටයම් සමූහය ඉන්දීය පාලසේන යුගයේ මහායාන බලපෑම් අනුව බුදුපිළිම ආශ්‍රිතව යෙදීම.
- හරස් පටි තුනක් සහිත තොරණ යෙදීම.
- අශ්ව ලාඩමක හැඩය රැස් මාලාව හා කේතු මාලාව යෙදීම.
- ධ්‍යාන බුදු රූ සහිත විමාන හතරක් පසුබිමේ දක්නට ලැබීම.
- මහායාන තාන්ත්‍රයානික ග්‍රන්ථයක් වූ "සාධනමාලා" ග්‍රන්ථයේ හැඳින්වෙන පරිදි වෛරෝචන, ආක්ෂෝභය, රත්න සම්භව අමිතාභ, අමෝඝ සිද්ධි යන ධ්‍යානි බුද්ධ මණ්ඩලය මෙම විමාන තුලින් මූර්තිමත් කෙරෙන බව පිළිගැනේ.
- මේ අනුව බෝධිසත්ව සංකල්පය නිරූපණය කිරීමට ගල්විහාර ශිල්පියා උත්සාහ ගෙන ඇති බව පෙනේ.

## 'ආ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**3.** මෞර්ය යුගයෙන් ඇරඹි බෞද්ධ කලාව පසු කාලීන සමස්ත ඉන්දීය කලාවන් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරවීමට සමත් විය.

(i) මෞර්ය යුගයේ ඉදිවූ බෞද්ධ ස්මාරක **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) භාරුත් ශිල්පියා චෛත්‍ය වටා ඉදි කළ ගල් වැටෙහි නිර්මාණ ආකෘතිය කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි.)

(iii) සාංචි තොරණ කැටයම් ශිල්පියාට බුද්ධ චරිතයේ සිද්ධීන් මෙන්ම ජාතක කතාද තම නිර්මාණ සඳහා පාදක විය. එම කැටයම්වල කලා ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(i)
- ★ ලෞරියා නන්දන්ගර් ස්ථම්භය
- ★ රාම්පූර්වා ස්ථම්භය
- ★ රුම්න්දෙයි ස්ථම්භය
- ★ සාරානාත් ස්ථම්භ ශීර්ෂය
- ★ සාංචි ස්ථම්භ ශීර්ෂය
- ★ බෂාර් බඛීරා ස්ථම්භය
- ★ නිග්ලිව ස්ථම්භය
- ★ සංකස්ස ස්ථම්භය
- ★ දිල්ලි තෝප්රා ස්ථම්භය
- ★ දිල්ලි මීරාට් ස්ථම්භය
- ★ කොල්හුවා ස්ථම්භය
- ★ ලෞරියා අරරාජ් ස්ථම්භය

(ii) භාරුත් ශිල්පියා චෛත්‍ය වටා ඉදිකළ ගල්වැටෙහි නිර්මාණ ආකෘතිය

- ★ ප්‍රාකාරය වටා ගල්කණු 80 කි.
- ★ මේවා ස්ථම්භ නමින් හැඳින්වේ.
- ★ ස්ථම්භ අතරට මාවර තුන බැගින් තිරස්ව යොදා ගල්වැට සවිමත් කොට ඇත.
- ★ මාවර සූචි නමින් හැඳින්වේ.
- ★ එක් ස්ථම්භයක් අඩි 7 අඟල් 1 උසය.
- ★ දොරටු රූපය ස්ථම්භ උසින් වැඩිය.
- ★ ගල් වැටෙහි ඉහල කොටස ප්‍රාකාර ශීර්ෂ ශිලාව ලෙස නම්කර ඇත.
- ★ ප්‍රාකාර ශීර්ෂ ශිලාව කෙටසෙහි සෙල්ලිපි සහිත සහ සෙල්ලිපි රහිත ජාතක කථා නිරූපිතය.

(iii) සාංචි කැටයම්වල බුද්ධ චරිතයේ සිද්ධීන් නිරූපිත කැටයම්

- ★ ජටිල දමනය
- ★ සංකස්ස පුරයට වැඩම කිරීම
- ★ වෛශාලිය අසලදී බුදුන් වහන්සේට වඳුරකු කළ පූජාව
- ★ මහාභිනිෂ්ක්‍රමණය
- ★ කපිලවස්තුපුර වැඩීම
- ★ මහාමායා සිහිනය
- ★ මාර පරාජය

සාංචි කැටයම්වල නිරූපිත ජාතක කථා

- ★ ඡද්දන්ත ජාතකය
- ★ මහාකපි ජාතකය
- ★ වෙස්සන්තර ජාතකය
- ★ අඛණ්ඩ කථන ශෛලිය උදා - වෙස්සන්තර ජාතකය
- ★ බුදුන්වහන්සේ වෙනුවට සංකේත යොදා ගැනීම
  (බෝගස, වජ්‍රය, ධර්මචක්‍රය, ශ්‍රී පතුල, වජ්‍රාසනය ආදිය)
- ★ රූපයකට රූපයක් මුවාවන ලෙස පෙන්නුම් කිරීම
- ★ අල්ප උන්නතව නෙලීම තුළ ත්‍රිමාණ ලක්‍ෂණ මතු කිරීම
- ★ තලය පිරී යන සේ මනා සංරචනය
- ★ ගස් කිසියම් ආකාරයක ශෛලිගත ස්වරූපයකින් දැක්වීම
- ★ රූප නිරූපනයේ සවිස්තරබව, මනා නිමාව, රචනා කිරීමේ සුවිශේෂ වූ හැකියාවකි.
  නිදසුන්
- ★ මහාභිනිෂ්ක්‍රමණය - සිදුහත් කුමරු වෙනුවට - ඡත්‍රය යොදා ඇත
- ★ ජටිල දමනය කැටයම - බුදුන් වෙනුවට - ගල් ආසනය යොදා ඇත
- ★ සංකස්සපුර දේවාරෝහනය - බුදුන් වෙනුවට - බෝගස යොදා ඇත

**4.** 16 වන සියවසේදී භාරතය පුරා මුස්ලිම් ආධිපත්‍යය පැතිරීමත් සමග එතෙක් පැවති කලාවන්, පර්සියානු ආභාසය මත මෝගල් කලා සම්ප්‍රදාය හා රාජ්පුට් කලා සම්ප්‍රදාය නමින් බිහි විය.

(i) මෝගල් යුගයේ ඉදි වූ අගනා වාස්තු විද්‍යා නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) මෝගල් චිත්‍රවලට තේමා වූ විෂයයන් දක්වා, ඒවා පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) රාජ්පුට් චිත්‍ර ශිල්පීන්ට තම නිර්මාණකරණය සඳහා හින්දු සාහිත්‍ය කෘති මූලාශ්‍ර බවට පත් විය. බිහි වූ කලා කෘති පදනම් කරගෙන කලාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 10 යි.)

(i)
- ★ රතු බලකොටුව
- ★ ටාජ් මහල්
- ★ හුමායන් සමාධිය
- ★ පර්ල් පල්ලිය
- ★ මොතාමස්ජිද් (මුතු පල්ලිය)
- ★ දිවානී ඛාස්
- ★ ඛාස් මහල්
- ★ ජාමාමස්ජිද් පල්ලිය
- ★ මුසාමන් බර්ජි
- ★ යමුනාවෙන් එතෙර නුර්ජාන් බිසවගේ සොහොන් ගෙය
- ★ සිකන්දරාහි තනා ඇති මහා අක්බාර් සිහිවටනය

(ii) 16 වන සියවසේ දී භාරතයේ මුස්ලිම් ආධිපත්‍ය පැතිරීමත් සමග ව්‍යාප්ත වූ මෝගල් චිත්‍ර කලාවේ නිර්මාණ සඳහා තේමාවන් වූයේ,

- ★ රාජසභා දර්ශන
- ★ දඩයම් දර්ශන
- ★ රජුගේ දෛනික ජීවිතය හා සම්බන්ධ දර්ශන
- ★ විවිධ පක්ෂීන්
- ★ සත්වරූප
- ★ මල්වර්ග
- ★ පැලෑටි
- ★ චිත්‍ර සඳහා වාස්තු විෂය කරගෙන ඇත
- ★ ආගමික අංශයෙන් බැහැරව අඳින ලද චිත්‍ර දැකිය හැකිය
- ★ හංසානාම, අක්බාර් නාම, චිත්‍ර අතර විශේෂත්වයක් ගනී

(iii) රාජ්පුට් චිත්‍ර ශිල්පීන්ට තම නිර්මාණකරණය සඳහා උපකාරි වූ සාහිත්‍ය කෘතීන් අතර

★ රාමායනය

★ මහාභාරතය

★ නල දමයන්ති

★ චෞර පංචසිකය

★ ගීතගෝවින්දය

★ පරමාෂා

★ රසික ප්‍රියය

★ මර්කන්ඩෙයි පුරාණය ප්‍රධාන වේ.

සාහිත්‍ය කෘතීන් ඇසුරින් බිහිවූ චිත්‍ර

★ රාධා ක්‍රිෂ්ණා ප්‍රේම වෘත්තාන්ත රාධා හමුවීමට පැමිණි ක්‍රිෂ්ණා, රෝගාතුර පෙම්වතිය

★ තම පෙම්වතා එනතුරු බලාසිටින දැරිය

★ කොටි දඩයම

බිල්හානා හා චම්පාවතී - ගෝපිකාවන් සමග සිටින ක්‍රිෂ්ණා

★ දියනාන ගෝපි ලඳුන්ගේ සළුපිළි සැඟවීම

★ ශිවනර්තනය, ක්‍රිෂ්ණ කාලිය නැමැති සර්පයා දමනය කිරීම

සිතුවම්වල කලා ලක්ෂණ

★ සිතුවම් ප්‍රමාණයෙන් කුඩා වීම

★ ජනකලා ස්වරූපයෙන් නිමවීම

★ ද්විමාන ශෛලියක් අනුගමනය කිරීම

★ විචිත්‍ර වර්ණ භාවිතය හා රන් පැහැය යොදා ගැනීම

★ නිරූපිත හැඩතල විස්තරාත්මකව දැක්වීම

★ වර්ණ භාවිතයේදී පැතලිබව කැපී පෙනීම

★ සියුම් රේඛා කරණය

★ පිරිසිදු නිමාව

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**5.** පුනර්ජීවන යුගයේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව නව ප්‍රවණතා කරා යොමු කරවීමට ගවේෂණයේ යෙදුන පසුකාලීන ශිල්පීන්ට හැකි විය.

(i) මයිකල් ආන්ජලෝගේ මූර්ති හතරක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) රෆායල් සැන්ටිගේ 'ඇතැන්ස් ගුරුකුලය' සිතුවමේ ආකෘතිය හා තේමාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) උපස්ථිතිවාදය, පශ්චාත් උපස්ථිතිවාදය හා ඝනරූපීවාදයේ කලා නිර්මාණයන්ගේ මූලික ලක්ෂණ වෙන් වෙන් වශයෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

- පුනර්ජීවන යුගයේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව නව ප්‍රවණතා කරා යොමු කරවීමට ගවේෂණයේ යෙදුන පසුකාලීන ශිල්පීන්ට හැකි විය.

(i)
- පියෙටා (PIETA)
- ඩේවිඩ් (DAVID)
- මෝසෙස් (MOSES)
- මියයන වහලා (DYING SALAVE)
- බඳින ලද වහලා (BOUND SALAVE)
  (කැරලිකාර වහලා REBELLIUS SALAVE)
- බැකස් (BACCHUS)
- දහවල සහ රාත්‍රිය - (ගලියානෝ මෙඩිචි සොහොන්ගෙය)
- අරුණෝදය හා හැන්දෑව (ලොරෙන්සෝ මෙඩිචි සොහොන්ගෙය)
- උර්බිනෝ ආදිපාදවරයා
- ලියා සහ රචල්
- ස්ව අලේඛ්‍ය මූර්තිය (BUST OF MECHAL ANGELO)

(ii) තේමාව -
- මෙම සිතුවම ග්‍රීක දර්ශනවාදය තේමාකොට ගෙන නිර්මිතය.
- ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සොක්‍රටීස්, ඉයුක්ලීඩ්, පයිතගරස්, ඩයොජීනියස් වැනි විද්‍යාඥයින් සහ දර්ශනවාදින් ඇතුළු 40 ට වැඩි පිරිසක් එකතු වී ශාස්ත්‍රිය සාකච්ඡාවන්හි නිරතවන අවස්ථාවකි.

ආකෘතිය -
- වතිකානු මාලිගයේ "ස්ටැන්සා ඩෙලා සිග්නැචුරා" ශාලාවේ බිත්තියක, අර්ධ චක්‍රාකාර වූ අවකාශයක සිතුවම් කොට ඇත.
- මෙම චිත්‍රයේ පෙරබිම, මැදබිම මානව රූප සඳහාද පසුබිම, මූර්ති සහිත සුවිසල් ගොඩනැගිල්ලක අභ්‍යන්තරය නිරූපනය සඳහාද යොදාගෙන ඇත.
- පෙරබිමේ මානවරූප කුඩා කාණ්ඩ වශයෙන් ගොනුවී ඇති අතර, සමස්ත රූප සංඛ්‍යාව තිරස් අතට විහිදුන අණ්ඩාකාර හැඩයකට ගලපා ඇත.

- ගොඩනැගිල්ලේ දර්ශනය පර්යාවලෝක මූලධර්ම නිවැරදි ලෙස යොදා ගනිමින් පෙරබිමේ සිට ඈතට විහිදෙන සේ දක්වයි.
- මෙහි ප්‍රධාන චරිත යුගලය වන ඇරිස්ටෝටල් සහ ප්ලේටෝ සම්පිණ්ඩනය මැදට යෙදීමෙන්, ගොඩනැගිල්ලේ ආරුක්කු හැඩය තුලට එම රූප ගොනු කිරීමක් නිසා එම චරිත ඉස්මතු කර පෙන්වයි.
  (මෙහිදී ඩාවින්චිගේ, අවසන් රාත්‍රී භෝජනය චිත්‍රයේ ජේසුස් වහන්සේගේ රූපය කවුලු රාමුව තුලට යොමුකළ ආකාර සිහිපත් වේ.)
- බුද්ධිමත් පිරිසක් එකතු වී ශාස්ත්‍රීය සාකච්ඡා පවත්වන ස්ථානයකට මනාව උචිත වන මෙවැනි වූ ගාම්භීර පෙනුමක් ගෙන දෙන පසුතලයක් නිර්මාණය වීම ශිල්පියාගේ මුහුකුරා ගිය සංරචන හැකියාව පිළිබිඹු කරවන්නකි.

(iii) උපස්ථිතිවාදය

- මූලික වශයෙන් ආලෝකය හා වාතාවරණය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම.
- සම්ප්‍රදායික ශාස්ත්‍රාලීය කලාවේ සිද්ධාන්තයන් නොසැලකීම.
- ආලෝකය නිසා වස්තූන්ගේ පෙනීම මොහොතින් මොහොත වෙනස්වන බව.
- යාබද වස්තූන්ගේ පැහැය සහ සෙවනැලිද එසේ වෙනස්වීමට හේතුවන බව.
- මේ තත්ත්වයන් අරමුණු කොට එළිමහනේ වස්තූන් සහ පරිසරය අධ්‍යයනය කිරීම නිසා තේමාවන් වෙනස් වීම.
- වර්ණ යෙදීමේදී වර්ණ කැටිති වශයෙන් එකලග තැබීම වර්ණ මිශ්‍ර නොකර අමිශ්‍ර වර්ණ යෙදීම, කෙටි පින්සල් පහර යෙදීම වැනි ශිල්ප ක්‍රම අනුගමනය.
- කලු වර්ණය භාවිත නොකිරීම.
- වස්තුවක සෙවනැලි ලෙස වර්ණ ගණනාවක් ඇති බව දැකීම.
- එඩුවාඩ් මනේ, එඩ්ගා ඩෙගා, ඇල්ෆඩ් සිස්ල් ශිල්පීන් උපත්ස්තිථිවාදී ශිල්පීන්ය.

කලා නිර්මාණ

- හිරු උදාව උපස්ථිතියක්
- වෝටර් ලු සහ ජපන් පාලම
- රොවුන් දේවස්ථානය
- හිරු එළියේ නිරුවත් කත
- නැටුම් පන්තිය
- නාන බේසම
- හිස පීරන ස්ත්‍රිය

හිරු උදාව

ක්ලෝඩ් මොනේ ශිල්පියාගේ කෘතියකි.

- ජල තලය සහිත පරිසරයකට හිරු උදාවන ආකාරය නිරූපිතය.
- වේගවත් කුඩා පින්සල් පහර භාවිත කර ඇත.
- ආලෝකය සහ සෙවනැලි ජලය තලය මත හැසිරෙන ආකාරය ග්‍රහනය කරගත හැකිය.
- වේගවත් රේඛා කිහිපයකින් ඇඳි බෝට්ටු කිහිපයකි.
- පැහැදිලි දර්ශනයක් නොපෙනෙන නිමාවක් නොමැති ස්වභාවයක් පිළිබිඹු වේ.
- හිමිදිරියේ එළිමහන් ස්වභාවයක් දැකිය හැකිය.

පශ්චාත් උපස්ථිතිවාදය

- ස්වභාවික වස්තූන්ගේ හැඩ සිලින්ඩරය ගෝලය සහ කේතුව වැනි ත්‍රිමාණ වූ හැඩයන්ගෙන් යුක්ත බව.
- වස්තූන්ගේ ක්ෂණිකව පෙනෙන මතුපිට ස්වභාවයට වඩා ඒවායේ ත්‍රිමාණ ගුණය දැක්වීමට උනන්දු වීම.
- වර්ණය තුළින් බොහෝ ගති ස්වභාවයන් ප්‍රකාශ කළ හැකි බව.
- එළිය අඳුර යෙදීමේදී වර්ණ පදාස වශයෙන් යෙදීම.
- රිද්මය චලනය මතුපිට ස්වභාවය, චමත්කාරය වර්ණයෙන් සහ පින්සල් පහරින් මතු කිරීම.
- උපස්ථිතිවාදය සම්භාව්‍ය කලාවක් දක්වා ඉහලට ඔසවා තැබීම.
- පෝල් සොසාන්, පෝල් ගොගැන්, වින්සන්ට් වැන්ගෝ යන ශිල්පීන් පශ්චාත් උපස්ථිතිවාදීන් වේ.

කලා නිර්මාණ

- වික්ටරි කන්ද
- අර්තාපල් බුදින්නෝ
- තරු පිරි රැය
- සයිප්‍රස් ගස්
- කහ පැහැති ක්‍රිස්තුස්වහන්සේ
- දෙවියන්ගේ දිනය
- ඇපල් වට්ටිය

තරු පිරි රැය -

- රාත්‍රී අහසක් සහ පරිසරයක් සහිත චිත්‍රයකි.
- වේගවත් කෙටි පින්සල් පහර රටාමය ස්වරූපයකින් හසුරුවා ඇත.
- වස්තූන්ගේ රිද්මය සහ චලන ස්වභාවය නිරූපිතය.
- එකිනෙකට ප්‍රතිවිරුද්ධ වර්ණ මූලික කොට වස්තූන්ගේ හැඩ ගොඩනගා ඇත.
- දර්ශනයේ පෙනෙන ස්වභාවයට වඩා භාවමය ආවේගයන් නිරූපණය වන අයුරින් දක්වා ඇත.

ඝනරූපිවාදය

- ඝනරූපිවාදය යනු අන්තර් සබඳතාවය පිළිබඳ කලාවකි.
- පශ්චාත් උපස්ථිතිවාදයේ අතුරු ඵලයක් ලෙස හැඳින්විය හැකිය.
- ඇසින් දකින රූපය නොව මනසින් දකින රූපය නිරූපණය වීම.
- ඒ අනුව තාත්වික කලාවේ සිද්ධාන්තයන් බිඳ දමා වස්තූන්ගේ සැබෑ පෙනුම නිරූපණයට යොමු වීම.
- වස්තූන්ගේ හැඩ නිරූපණයේ දී ජ්‍යාමිතික හැඩතලයනට කඩා චිත්‍ර තලය මත ගොනු කිරීම.
- වස්තූන්ගේ සැබෑ ස්වරූපයට වඩා තම සංකල්ප හැඟීම් ප්‍රතික්‍රියා නිරූපණය සඳහා භාවමය ප්‍රකාශනයකට නැඹුරු වීම.
- පැබ්ලෝ පිකාසෝ, ජෝජස් බ්‍රාක්, ඝණිකවාදී චිත්‍ර ශිල්පීන් වේ.
    - ගුවර්නිකා
    - අවිග්නොන්හි යුවතියෝ
    - වැලපෙන කත
    - නිවාස සහ ගස්
    - ගිටාරයක් සහිත මිනිසා
    - පාදම සහිත මේසය

අවිග්නොන්හි යුවතියෝ

- අභිසරුලියන් තේමාව වී ඇත.
- ඝනිකවාදයේ ආරම්භක සිතුවමයි.
- කාන්තා රූප පහකින් යුතු සම්පිණ්ඩණයකි.
- අභිසරුලියන්ගේ රූපස්වභාවය නිරූපණය කිරීම වෙනුවට ඔවුන් පිළිබඳ වූ ශිල්පියාගේ හැඟීම් නිරූපණය කර ඇත.
- කාන්තා රූපවල ස්වභාවික පෙනුම ජ්‍යාමිතික හැඩතලවලට චිත්‍ර නිරූපණය කර ඇත.
- විෂයානුබද්ධව නිරූපිත පර්යාවලෝක ලක්ෂණ සහ ත්‍රිමාණ ලක්ෂණ නිරූපිතය.

**6.** බයිසන්තියානු හා ගොතික් කලා නිර්මාණයන් ක්‍රිස්තු දේවස්ථාන ඇසුරෙන් වර්ධනය විය.

(i) බයිසන්තියානු දේවස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ගොතික් සම්ප්‍රදායට අයත් ප්‍රංශයේ නොත්‍රෙඩැම් දේවස්ථානයේ ගෘහ නිර්මාණ ලක්ෂණ හා අලංකරණය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) "ජස්ටිනියන් අධිරාජ්‍යයාගේ පාලන සමය බයිසන්තියානු කලාවේ ස්වර්ණමය අවධියයි." නිදසුන් සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 10 යි.)

බයිසන්තියානු හා ගොතික් කලා නිර්මාණයන් ක්‍රිස්තු දේවස්ථාන ඇසුරෙන් වර්ධනය විය.

(i)
- හේගියා සොෆියා
- සැන් විටාලේ
- ශාන්ත කැතරින්
- ශාන්ත ඇපොලිනරිනෝවෝ
- හේගියා අයරින්

(ii)
- පිටතට පැන්නු කුලුනු සහිත උස්වූ බිත්ති
- බොකුවහල ක්‍රමය හා ගොඩනැගිල් මැද සිට ඉහලට විහිදුන කොත
- ජනෙල් කවුලු හා දොර කවුලු මුදුන්වල උල්වූ ආරුක්කු හැඩ
- ඉදිරිපස දෙපැත්තේ ඇති හතරැස් කුලුණු වැනි නිර්මාණ යුගලය
- ඉදිරිපස ප්‍රධාන දොරටුවට ඉහලින් ඇති වටකුරු විදුරු ජනේලය (ROSE WINDOW) හා එවැනි ජනේල ගොඩනැගිල්ලේ දෙපසින්ද යෙදීම
- උස් වූ බිත්තිවලට ශක්තිය දීම සඳහා බිත්තියේ සිට පිටතට විහිදුනු ආරුක්කු වැනි නිර්මාණ
- ඉදිරිපස පෙනුම අනුව තට්ටු තුනක ගොඩනැගිල්ලක් මෙන් දිස්වීම. (එය "ට්‍රයිෆෝරියම්") නමින් හැඳින්වීම)
- රංජිත වීදුරු සිතුවම් සහිත කවුලු
- දොර කවුලු වල ආරුක්කු හැඩයේ කැටයම් නිර්මාණය වීම
- සුවිසල් ගැලරියකින් සහ මාර්ගපථ සහිත වීම

(iii) <u>ජස්ටිනියන් රජ සමයේ කලාව</u>

- හේගියා සොෆියා, සැන්විටාලේ සහ ඇපලිනරිනෝවෝ යන දේවස්ථාන ගොඩනැංවීම.
- කොන්ස්තන්තිනෝපලය කලා නිර්මාණ සඳහා වූ කීර්තිමත් නගරයක් බවට පත් කිරීම.
- ජස්ටීනියන් රජු කලාවේ අනුග්‍රාහකයකු වීම.
- ඔහුගේ අනුග්‍රහය ලබා නිම වූ කෘතීන් උසස්කෘතීන් ලෙස සැලකීම.
- දේවස්ථාන තුළ මොසෙක් කලා නිර්මාණ අතිශය දියුණු තත්ත්වයකට පත් කිරීම.
- සැන්විටාලේ දේවස්ථානය තුළ නිම වූ "ජස්ටීනියන් අධිරාජ්‍ය රාජ සභාවේ සභිකයන් සමග සිටින සිතුවම" හා "තියොඩෝරා රැජින සහ සේවිකාවන්" යන කෘතීන් මොසෙක් කලාවේ අගනා කෘතීන් වේ.
- වර්ණවත් වීදුරු කැබලි සහ ගල්කැබලි බදාමය මත ඇලවීමෙන් (ටෙසරි) තල මෙම සිතුවම් සියුම් වූද වර්ණවත් වූද හැඩතල ගොනුකිරීම තුළින් වර්ණ චිත්‍රයන් තරමට පෙනීමත් ගෙන දීමට සමත් වීම.
- මානව රූපවල ඍජුදර්ශි පෙනුම, දිගටි හැඩතල, ද්විමාන පෙනුම කැපී පෙනුනද ගාම්භීර මහේශාඛ්‍ය පෙනුමක් පිළිබිඹු වීම.

## 11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

### අභිමතාර්ථ

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැන බැලීම.

2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.

3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

මේ සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයා ඇති අනුහුරු අභ්‍යාස පොත පිරිශීලනය කිරීමෙන් ගුණාත්මක ඇගයීමක ප්‍රවේශයක් හා උපදේශනයක් ලබාගත හැකිය. එහි දක්වා ඇති උදාහරණ අනුව ලකුණු ප්‍රදානය කිරීමේදී නිර්ණායක පදනම් කරගැනීම අත්‍යවශ්‍ය වේ.

11. වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයින් ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ළඟා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහි දී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

### ලකුණු දීමේ නිර්ණායක

1 - ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව - ලකුණු 20
2 - ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව - ලකුණු 20
3 - සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය
(පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) - ලකුණු 20
4 - වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම - ලකුණු 20
5 - චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව - ලකුණු 20
11. වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු - ලකුණු 100

III පත්‍රය

❖ මෙම පත්‍රය කොටස් තුනකින් සමන්විත වන අතර එම කොටස් තුනෙන්ම තෝරාගත් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක චිත්‍රයක් පමණක් ඇඳීම අපේක්ෂා කෙරේ.
"අ" චිත්‍ර සම්පිණ්ඩනය
"ආ" මෝස්තර හා සැරසිලි නිර්මාණය
"ඉ" ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

යන කොටස් සඳහා ලැබෙන පිළිතුරු පත් ඇගයීමේදී ඒ එකිනෙකට අයත් නිර්ණායකයන්ට අනුව තක්සේරු කර ලකුණු ප්‍රදානය කළ යුතු වේ.

මේ සඳහා ද ඉහත කී අනුහුරු අභ්‍යාස පොත ඔබට මහගු අත්වැලක් සපයනු ඇත. එහි දක්වා ඇති උදාහරණ අවබෝධ කරගෙන ඒ අනුව නිර්ණායකයන්ට අනුව ලකුණු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය වේ.

## 111. පත්‍රය - "අ" චිත්‍ර සම්පිණ්ඩනය

අභිමතාර්ථ - ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ස්වාභාවික මෙන්ම නිර්මිත පරිසරයන්ගේ හා වස්තූන්ගේ ස්වභාවයත් ඒ තුළ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදාමයන් පිළිබඳවත් ලබා ඇති අත්දැකීම් චිත්‍රමය භාෂාවෙන් ප්‍රකාශ කිරීමේ නිර්මාණශීලී කුසලතාව හා රසඥතා වර්ධනය ඇගයීම.

අපේක්ෂකයන් තෝරාගෙන ඇති මාතෘකා ප්‍රකාශනය කිරීමේ දී විවිධ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති අයුරු දක්නට ලැබේ. රේඛාව හැසිරවීමේ හා හැඩතල ප්‍රකාශනයේදී අවම කුසලතා මෙන් ම උපරිම කුසලතා ප්‍රදර්ශනය ක අවස්ථා දැකිය හැකි ය. වර්ණ භාවිතය තුළින් හා විවිධ වූ ශිල්ප ක්‍රම භාවිතයෙන් උපරිම කුසලතා දක්වන අය මෙන් ම ප්‍රායෝගික කුසලතා පෝෂණය කර නොගත් අපේක්ෂකයෝ ද වෙති. මේ නිසා එකිනෙක අපේක්ෂකයන් පෙන්වා ඇති ප්‍රායෝගික කුසලතාවන්ගේ මට්ටම හඳුනාගෙන ඒ අනුව නිර්ණායක පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කළ යුතු වේ. මෙහිදී ද පුද්ගල බද්ධ රුචිකත්වය ගැන නොසලකා ලකුණු ප්‍රදානය කළ මැනවි.

## 111. පත්‍රය -"ආ" මෝස්තර හා සැරසිලි නිර්මාණය

අභිමතාර්ථ - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලි සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

111. වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී සැහෙන අපේක්ෂක සංඛ්‍යාවක් "ආ" කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අයද බොහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති හැකියා හා කුසලතා වන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති කුසලතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

### ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 2 - | පාරිභාරික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු 20 |
| 3 - | රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 20 |
| 4 - | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු 20 |
| 5 - | විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 20 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 100 |

## 111. පත්‍රය -"ඉ" ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

අභිමතාර්ථ - වාණිජ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලි සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

### ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 2 - | වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු 20 |
| 3 - | රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 20 |
| 4 - | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු 20 |
| 5 - | විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 20 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 100 |

සටහන් ..........................